
## ආයුර්වේදය

# අපේ චින්තනයේ සහ වෙදකමේ මහිමය

**මහාචාර්ය ගුණපාල ධර්මසිරි**



> නූතන විද්‍යාව සහ බටහිර වෙදකම යන දෙකෙන්ම දැනටමත් හුගක් ප්‍රශ්න බටහිර රටවල් තුළම මතු වී තිබෙන බව ද පැහැදිලිව ම පෙනෙන කරුණකි. ඒ මතු වී ඇති ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා දැන් ඒ අය අපේ රටවල්වලින් ඉගෙන ගන්න උත්සාහ කරමින් සිටිති.

අප මෙහිදී පළමුව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ නූතන විද්‍යාව සහ නූතන වෙදකම මිනිස් ජීවිතය කෙරෙහි බලපා තිබෙන ආකාරයත් දැනට බලපා-ගෙන යන ආකාරයත් ය. එහිදී මතු-වන ගැටළුවලට පිළියම් ලෙස අපේ චින්තනයේ සහ අපේ වෙදකමේ අදාළත්වය දෙවනුව සාකච්ඡා කරමු. මේ මාතෘකාව අපේ රටවල්වලට විශේෂයෙන් ම වැදගත් වන බව කිව යුතුයි. මක්නිසාද, හොඳින් පරීක්ෂා-කාරීව කල්පනා කර බැලුවහොත් අපට පෙනී යන දෙයක් නම් නූතන විද්‍යාව සහ බටහිර වෙදකම යන මේ දෙක ම අපේ ඒවා නොවන බව ය. මේවා අධිරාජ්‍යවාදයත් සමග මෙහාට පැමිණි බලවේගයත් ය. අප මේවා ගැන වැඩිදුර කල්පනා නොකර ඒවා බාර ගැනීම නිසා අපි ලොකු අමාරුකම්වල දැනට වැටී සිටින බව පෙනේ. තවදුරටත් බර-පතල අමාරුකම්වල වැටෙන්නට ඉඩ තිබෙන බව ද පෙනේ. ඇත්-තෙන්ම කිවහොත්, මේ නූතන විද්‍යාව සහ බටහිර වෙදකම යන දෙකෙන්ම දැනටමත් හුගක් ප්‍රශ්න බටහිර රටවල් තුළම මතු වී තිබෙන බව ද පැහැදිලිව ම පෙනෙන කරු-ණකි. ඒ මතු වී ඇති ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා දැන් ඒ අය අපේ රටවල්වලින් ඉගෙන ගන්න උත්සාහ කරමින් සිටිති. එබඳු තත්ත්වයක් ඇති මෙබඳු අවධියක අපි ටිකක් විමසිලිවත්ව කල්පනා කර බැලුවහොත් එය ඉදිරියට එන ප්‍රශ්න මගහරවා ගැනීමට හුගක් ප්‍රයෝජනවත් විය හැකියි.

අප සාමාන්‍යයෙන් විද්‍යාව ගැන හිතන්නේ එය ඉතා නිරපේක්ෂක වූ සහ මධ්‍යස්ථ වූ ශාස්ත්‍රයක් ලෙසටයි. එය අප අනිවාර්යයෙන්ම පිළිගන්නා වූ පිළිගත යුත්තා වූ ද සාර්ව භෞමික සත්‍යයක් හැටියට සැල-කෙන තත්ත්වයකට පත්ව තිබේ. නමුත් ඇත්ත වශයෙන් කල්පනා කර බැලුවහොත්, විද්‍යාව යන්න එක්තරා අන්දමක අධිරාජ්‍යවාදී වූ ද ඉතා දරුණු වූද දේශපාලන බලවේගයක් බව අපට ඉතා හොඳින් දැකිය හැකි වෙයි. අප පළමුවෙන්ම පැහැදිලිව අවබෝධ කරගත යුතු පිළිගත යුතු කාරණය වන්නේ එය ය. විද්‍යාව ගැන කථා කරන විට එය තුළ ගැබ්-වන්නා වූ අදහස් දෙකක් වෙන් කර-ගත යුතුයි. එකක් නම්, විද්‍යාත්මක ක්‍රමයයි. අනෙක නම්, තාක්ෂණයයි.

විද්‍යාව අද හුගක් සම්බන්ධ වන්නේ තාක්ෂණයටයි. එහෙත්, විද්‍යාව සම්බන්ධව ප්‍රධාන වශ-යෙන්ම වැදගත් වන්නේ විද්‍යාත්මක ක්‍රමයයි. එය පළමුවෙන්ම ලෝකයට හඳුන්වා දුන්නේ බුදුරජාණන් වහන්සේ යි. එය උන්වහන්සේ පැහැදිලි කර දුන්නේ කාලාම සූත්‍රයේ දී යි. එහිදී උගන්වන ලද්දේ අප විසින් පිළිගන්නා ඕනෑම අදහසක් පළමුවෙන් පිළිගත යුතු බවයි. අප කවුරුත් විසින් අනුගමනය කළ යුතු වැදගත් මූලධර්මයක් ලෙස මෙය පැහැදිලි ය. මෙම මූලධර්මය ඉදිරි-පත් කරන ආකාරයක් පෙන්නුම් කරමින් විද්‍යාව ඉදිරියට එන්නේ නමුදු, ඇත්ත වශයෙන් විද්‍යාව මගින් කරන්නේ ඊට හාත්පසින් ම විරුද්ධ වූ වැඩ පිළිවෙලක් බව එළිදරව් වෙමින් පවතී. දැන් විද්‍යාව මගින් කියා සිටින්නේ බටහිර සංස්කෘ-තියේ එන ශිල්ප සහ ශාස්ත්‍ර ක්‍රම පමණක් විද්‍යාත්මක වන බවය. ඒ අනුව, අනෙකුත් සංස්කෘතීන්හි එන ශිල්ප ශාස්ත්‍ර ක්‍රම අවිද්‍යාත්මක වූ ද ප්‍රාථමික වූ ද ඒවා ලෙස විද්‍යාව මගින් හංවඩු ගසනු ලැබේ. එසේ ඒවා අවිද්‍යාත්මක යැයි කියුවද, ඒවා එසේ අවිද්‍යාත්මක යැයි පැහැදිලි කිරීම සඳහා කිසිදු විද්‍යාත්මක පරීක්ෂණයක් මෙතෙක් ඉතිහාසයේ කෙරී නැත. එමනිසා, එම හංවඩු ගැසීම අතිශයින් අවිද්‍යාත්මකවූද, ආධානග්‍රාහී වූවක් ද වන්නේ ම ය. එයින් සිදුවන්නේ එම වෛකල්පික ශිල්ප ශාස්ත්‍ර විනාශ කර දැමීමට කටයුතු සකස් කිරීම ය.

බටහිර විද්‍යාව සහ බටහිර වෛද්‍ය ශාස්ත්‍රය මගින් කියා සිටින්නේ අපේ පෙරදිග වෙදකම මිත්‍යාවන් හෙවත් නොදියුණු අදහස් සමූහයක් පමණක් බවයි. විද්‍යාත්-මක චින්තනයට අනුව නම් එසේ කිව හැක්කේ පෙරදිග වෙදකම සහ අපරදිග වෙදකම අතර සංසන්ද-නාත්මක පර්යේෂණයන් පැවැත්වී-මෙන් පසුව පමණ ය. එහෙත් එබඳු පර්යේෂණ ලෝක ඉතිහාසයේ කිසි දිනක කෙරී නැත. එසේ කරන්නට අදහසක් ඇති බවක්වත්

පෙනෙන්නට නැත. බටහිර වැස්සන්ගේ එම මෝඩ අදහස් පසු පස යාම නිසා අප කරන්නේ අප සතු මහාර්ඝ වූ දේශීය ශිල්ප ශාස්ත්‍රයන් අප විසින් ම විනාශ කර ගැනීම ය. මෙහි ඇති ඛේදවාචකය නම් අප විසින් ම අපේ ම මිනිවල කපා ගැනීම ය. අපේ සංස්කෘතීන් විනාශ කර දමා බටහිර ආධිපත්‍යය මෙහි පතුරුවා දැමීමට දේශපාලනමය ආධාරකයක් හෝ බලයක් ලෙස විද්‍යාව යන්න දැන් ක්‍රියාත්මක වෙමින් පවතියි. මේ අයුරින්, විද්‍යාව යන්න ආධානග්‍රාහී වූ භයානක චින්තන ක්‍රමයක් බව අප විසින් අවබෝධ කර ගත යුතුව ඇත.

ලෝකයේ ඇති විවිධ වෛද්‍ය ශාස්ත්‍ර ගත් විට අවුරුදු 3000 ක් පමණ කාලයක් තිස්සේ පවතින වෛද්‍ය ශාස්ත්‍ර අප අතර තිබෙන බව දැකිය හැකිය. එහෙත් බටහිර ඇති නූතන වෙදකම අවුරුදු 200 කට හෝ 300 කට වඩා පැරණි නැත. මෙම වෙදකම අපේ රටවලට අවුත් අපේ වෛද්‍ය ශාස්ත්‍ර විනාශ කර දැමීම නිසා, මනුෂ්‍ය සංහතිය සතුව ඇත්තාවූ බොහෝ වටිනා විද්‍යා ශාස්ත්‍රයන් විනාශ වී යන බව පෙනේ. එමගින් සිදුවන්නේ අපේ රටවල් චින්තන කාන්තාර බවට පත්කර දැමීම ය. එමනිසා, මෙය අප බොහෝ කල්පනාකාරී විය යුතු කරුණක් වන්නේ ය. මෙය අපේ ජීවිත කෙරෙහි ඉතා තීරණාත්මක ආකාරයකින් බලපාන කරුණකි. මක්නිසාද, අපේ ජීවිත සහ අපේ සෞඛ්‍යය වැනි දේ ආරක්ෂා කර ගැනීම සඳහා අවුරුදු තුන්දහස් ගණනක් අප සමග එකට සිටියාවූ වෛද්‍ය ක්‍රම සහ සුව කිරීමේ කලාවන් අභාවයට පත්වීගෙන යන නිසා ය. මෙය අපේ ජීවිතවලට බලපාන භයානක තර්ජනයක් වී ඇති බව මනාව අවබෝධ කර ගත යුතු ය.

විද්‍යාවෙන් සිදුවන තවත් භයානක ප්‍රතිඵලයක් නම්, විද්‍යාව සහ තාක්ෂණය අපේ රටවලට පමණක් නොව මුළු මහත් ලෝකයට ම මහා විපතක් බවට පත්වෙමින් තිබීමය. තාක්ෂණික දියුණුව නිසා ලොව පරිසරය විනාශ වී යන බව කවුරුත් දැන් දන්නා වූ කරුණකි. ගස් කොළත් විනාශ වී පරිසරය දූෂණය වීම නිසා අපේ පරිසරයම දැන් අප-ටම විරුද්ධව ක්‍රියාත්මක වෙමින් පවතියි. මේ ලෝකයේ තිබෙන ගංගා ඇළ දොළ ගතහොත්, බටහිර ලෝකයේ තිබෙන කිසිම ඇළ පාරකින් දිය දෝතක් අරගෙන බොන්න බැරි තත්ත්වයක් උදා වී ඇත්තේ ය. මක්නිසාද, විවිධ විෂ වර්ග සහ රසායනයන් කෙතරම් ප්‍රමාණයක් මේ දිය පාරවල්වලට එකතුවෙලා ඇත්දැයි කිවහොත්, මේ ළඟක දී ඇමරිකාවේ ගඟක් ගිනිගත් බව වාර්තාවී තිබුණි. ගඟක් ගිනි ගත්තා

> අලුත් අලුත් විවිධ ප්‍රතිජීවක දැන් නිෂ්පාදනය වෙමින් පවතියි. මේ ආකාරයෙන් මරාගෙන මරාගෙන යන විට මහා අරුම පුදුම දෙයක් සිදුවන්නට පටන් ගෙන ඇති බව පෙනේ. එසේ මරා දැමූ විෂබීජ අලුත් අලුත් වඩා ප්‍රබල වූ විෂබීජ ප්‍රභේද ලෙස මතුවන්නට පටන්ගෙන ඇත.


අපූර්ව සිද්ධිය බලාගන්නට බොහෝ ජනයා එහි පැමිණි බව ද සඳහන් වී තිබුණි. මේ ආකාරයේ ඇළ දොළ දූෂණය ලංකාවේ ද ඉතා බහුලව දැන් සිදුවෙමින් පවතියි. විවිධ කෘෂි රසායනයන් නිසා මහ පොළොව ම කාන්තාරයක් බවට පත්වෙමින් තිබෙයි. විද්‍යාවෙන් කර ඇති උසස්ම ජයග්‍රහණයන් අතර එකක් නම් හඳට යන්නට හැකිවීම ය. අප මෙතැනදී කල්පනා කර බැලිය යුත්තක් නම්, ළඟ ඇති දිය පාරකින් දිය දෝතක් බොන්නට නොහැකි නම්, හඳට යාමෙන් ඇති ඵලය කුමක් ද යන්නයි. මේ ආකාරයෙන් විශාල මානසික වික්ෂිප්ත තත්ත්වයක් සහ ලෝක විනාශයක් නූතන විද්‍යාව මගින් සිදුකරමින් සිටින බව අප විසින් අවබෝධ කර ගත යුතුයි. හැම තාක්ෂණික දියුණුවකින් ම ඇතිවන උප ප්‍රතිඵල මනුෂ්‍ය ජීවිතයට සහ මේ පොළොවට සැම විටම අනර්ථකාරී වන්නේ ය. බටහිර සංස්කෘතිය විසින් 'දියුණුව' යන්න දෙස බැලුවේ බාහිර වශයෙන් ය. එනම්, යන්ත්‍ර සූත්‍ර ආකාරයෙන් ඇතිවන විපරිණාමයන් වශයෙනි. බාහිර පැත්තෙන් ඉතා දියුණු යැයි සිතන තත්ත්වයන් ඇතිකරලීමට බටහිර අය කෙතරම් සමත් වුවත්, එයට සාපේක්ෂ අභ්‍යන්තර දියුණුවක් ඔවුන් තුළ කිසිසේත්ම ඇතිවූයේ නැත. මේ ආකාරයෙන් මිනිස් මනස මෙන් ම මහ පොළොව ද සහමුලින් විනාශ වී යන දරුණු තත්තවයකට අපි දැන් මුහුණ දී සිටිමු. මේ සියල්ලම සිදුවන්නේ කුමක් නිසා ද? විද්‍යාව නිසා ය. මෙසේ මා පැහැදිලි කළේ 'විද්‍යාව' යන්නෙන් සිදුවී ඇති භයානක අනතුරු දෙකක් ගැන යි.

ඊළඟට අපි වෛද්‍ය ශාස්ත්‍රය දෙසට හැරෙමු. දැන් අපේ රටවලත් මූලික වශයෙන් පොදුව පිළිගත් වෛද්‍ය ක්‍රමය ලෙස අප සලකන්නේ බටහිර වෛද්‍ය ක්‍රමයයි. බටහිර වෙදකම තුළ ද අර විද්‍යාව තුළ සිදුවුන ආකාරයෙන්ම භයානක පරස්පර විරෝධී තත්ත්වයන් මතු වී ඇත්තේ ය. විද්‍යාවට තවදුර ඉදිරියට යන්න බැරි ආකරයෙන්ම බටහිර වෙදකමට ද තවදුර ඉදිරියට යා නොහැකි තත්ත්වයක් මතු වී ඇති බව පෙනේ. මෙය ඉතා හොඳින් පෙනෙන්නේ අපේ පෙරදිග සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම හා සංසන්දනය කර බලන විට ය. උදහරණයක් වශයෙන් බටහිර වෙදකමේ කේන්ද්‍රීය ඖෂධ ලෙස සලකනු ලබන්නේ ප්‍රතිජීවක නම් ඖෂධයි. ඒවායින් මූලික වශයෙන් කරන්නේ අපට විරුද්ධව එන විෂබීජ හෙවත් විවිධ ක්ෂුද්‍ර ජීවීන් මරා විනාශ කර දැමීමයි. අලුත් අලුත් විවිධ ප්‍රතිජීවක දැන් නිෂ්පාදනය වෙමින් පවතියි. මේ ආකාරයෙන් මරාගෙන මරාගෙන යන විට මහා අරුම පුදුම දෙයක් සිදුවන්නට පටන් ගෙන ඇති බව පෙනේ. එසේ මරා දැමූ විෂබීජ අලුත් අලුත් වඩා ප්‍රබල වූ විෂබීජ ප්‍රභේද ලෙස මතුවන්නට පටන්ගෙන ඇත. මේ නිසා දැන් එන්න එන්නම සිදුවෙගන යන්නේ සියලු ආකාරයේ ප්‍රතිජීවකවලට ඔරොත්තු දෙන අති භයානක විෂබීජ පහළ වන්නට පටන් ගැනීමයි. මෙම දරුණු විෂබීජ ලෝකය පහළ වන්නේ සෘජු වශයෙන් ම බටහිර ඖෂධවල ප්‍රතිඵල ලෙස බව අප හොඳින් මතක තබා ගත යුතුයි. මේ කරුණ නිසා බටහිර වෙදකමට මින් එහාට යන්නට බැරි තත්ත්වයක් උදාවී තිබෙන බව දැන් බටහිර ලෝකය විසින් ම පිළිගෙන හමාරය. ඒ නිසා බොහෝ දෙනෙක් බටහිර වෙදකමෙන් ඈත්වී ආයුර්වේදය සහ කටු චිකිත්සාව වැනි පෙරදිග වෙදකම සොයා ගෙන යන්නටත් ඒවා ගැන විශාල උනන්දුවකින් ගවේෂණය කරන්නටත් පටන් ගෙන ඇත. ඇමරිකාව වැනි රටවල එම වෙදකම් ඉතා ජනප්‍රිය වී ගෙන යමින් පවතියි.

මෙතැන වෙන පටලැවිල්ල කුමක්දැයි කියා අපි පළමුවෙන් ම තේරුම් ගත යුතුයි. බටහිර වෙදකම පදනම්ව පවතින මූල ධර්මය කුමක්ද කියා මෙතැනදී තෝරා බේරා ගත යුතුයි. එය නම්, මරා දැමීමයි. ප්‍රතිජීවක යනු ජීවිතයට විරුද්ධ යනුයි. මරාදමන සංකල්පය ඔස්සේම ගොස් මිනිස් සංහතියට කිසිම දෙයක් පිළිබඳ දියුණුවක් ලබා ගත හැකි වන්නේ නැති බව සනාතනික සත්‍යයක් ලෙස අප පරමාර්ථ වශයෙන් ම අවබෝධ කර ගත යුතුයි. මරන්න මරන්න සතුරා වඩ වඩා බලසම්පන්න වෙයි. බටහිර වෙදකමින් ඔබ්බට ගොස් මෙම තත්ත්වයට හේතුවන්නේ කුමක්දැයි සොයා බැලුවහොත් අපට පෙනෙන්නේ එය බටහිර සංස්කෘතිය සහ විද්‍යාව මත පදනම්ව ඇති ආකාරයයි. එම සංස්කෘතිය පදනම්ව ඇත්තේ බටහිර ආගම මතයි. ඔවුනට අනුව දෙවියන් වහන්සේ ලෝකය මවා ඔවුන්ට ඕනෑ දෙයක් කරගන්නැයි කියා මිනිසුන්ට බාර දී ඇත. ඒ නිසා මිනිසුන් ඕනෑ ඕනෑ දේවල් කරන්නට පටන් ගත්හ. අන්තිමට සිදු වූයේ ලොව සියලු දේ විනාශ වී ලෝකයත් විනාශ වෙන තත්ත්වයට පත් වීම ය. බටහිර ආගමේ මූලික දේ නම් සතුරා මරා දැමීමයි. යම්කිසි ගෝත්‍රයක් ගැන දෙවියන් වහන්සේ අප්‍රසාදයට පත්වුවහොත් එතුමාගේ අනුගාමිකයන්ට අණ කරන්නේ වහාම ගොස්

එම ගෝත්‍රයම මරා දමන ලෙසට ය. බයිබලයේ පරණ තෙස්තමේන්තුව බැලුවහොත් මේ කාරණය ඉතා පැහැදිලිව පෙනී යනු ඇත. බටහිර වෙදකමට ඇතුළු වී තිබෙන්නේ ද ඒ විධික්‍රමය ම ය. මේ කරුණ නිසා, බටහිර වෙදකම න්‍යායාත්මක වශයෙන් ම අවසානයකට පත්ව ඇත්තේ ය. ප්‍රතිජීවක මගින් කෙරෙන්නේ අපට විරුද්ධව එන ක්ෂුද්‍ර ජීවීන් මරා දැමීමයි. මෙම ක්ෂුද්‍ර ජීවීන් අතර අපට හිතවත් අය ද, විශේෂයෙන් ම අපේ බඩවැලේ සිටිති. ඒ අය අපට බොහෝ උදවු උපකාර කරති. අපේ ප්‍රතිශක්තීන් රඳා පවත්නේ ඔවුන් මත ය. ප්‍රතිජීවක මගින් අපට විරුද්ධ ජීවීන් මරා දමන විට සමග ම අපට හිතවත් අයද විශාල වශයෙන් ඉබේම මරා දැමීමක් සිදු වෙයි. ඒ ආකාරයෙන් අපට හිතවත් කණ්ඩායම් විශාල වශයෙන් මැරී ගිය විට, අපේ ශරීරයේ ප්‍රතිශක්ති ඌනතාවක් ඉබේම ඇති වෙයි. ඒ නිසා දැන් පර්යේෂණ මගින් සොයා ගෙන තිබෙන දෙයක් නම් බහුල ප්‍රතිජීවක භාවිතය නිසා ඒඩ්ස් රෝගය වැළඳෙන බවයි. ඇත්තෙන්ම මෙම සොයා ගැනීම සඳහා පර්යේෂණ කළ යුතුම නැත. ප්‍රාග් අනුභූතිකව ම අපට මේ නිගමනයට එළඹෙන්නට හැකියාව ඇත. හුදු චින්තනයෙන්ම පමණක් අපට එම නිගමනය කරා පහසුවෙන් ම ළඟා විය හැක. මේ ඒඩ්ස් වර්ගයට අලුත් නමක් හදා එය 'රසායනික ඒඩ්ස් (chemical aids)යනුවෙන් නම් කර තිබේ. මෙය බටහිර වෙදකම නිසා අපට සිදුවිය හැකි බරපතල අවදානමක් බව දැන්වත් පැහැදිලි විය යුතු ය.

අනෙක් පැත්තෙන් බලන විට, මෙම බටහිර වෙදකම මහා පරිමාණයේ ජාවාරමක් බවට පත් වී ඇත්තේ ය. එය ඖෂධ සහ වෛද්‍ය සේවා ජාවාරමක් හැටියට නම් කරන්නට හැකිය. දැන් හොර බෙහෙත් සහ බොරු බෙහෙත් විශාල වශයෙන් නිෂ්පාදනය වෙමින් පවතියි. විශේෂයෙන් ම ආසියාතික රටවල මෙය බහුලව සිදුවෙන බව වාර්තා වේ. 1998 අවුරුද්දේ ජනවාරි 16 දින දරන ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සඟරාවක් වන ටයිම් සඟරාවේ මේ ජාවාරම ගැන දීර්ඝ



අපේ වෙදකම අවුරුදු 3000 ක් තරම් පැරණි වන්නේ ය. අපේ සංස්කෘතිය තුළ මේ ලෝකය එතරම් අද්භූත වූවක් නොවේ. එය සාමාන්‍ය වූ සිද්ධියකි. එමෙන් ම රෝගය යන්නද කිසිම අස්වාභාවික දෙයක් නොව, සාමාන්‍ය වූ දෙයකි.

ලිපියක් පළවී ඇත. මෙම හොර බෙහෙත් නිෂ්පාදනය ප්‍රධාන රටවල් නම්, ඉන්දියාව, චීනය, පාකිස්තානයසහ තායිලන්තයයි. පැරසිටමොල් වැනි සුදු පාට බෙහෙත් පෙති බොහොමයක් සාදා ඇත්තේ රට හුණු කුඩුවලින් බව එම වාර්තාවේ සඳහන් වෙයි. බොහොමයක් එන්නත් දියර හැටියට ඇත්තේ සීනි වතුර හෝ ලුණු දියර පමණක් බව ද සඳහන් ය. මේ ආකාරයට මේවා වර්ධනය වෙමින් එන නිසා අප මේ කරුණු ගැන ඉතා සැලකිල්ලෙන් පසුවිය යුතුයි. මක්නිසාද, වෙදකම කෙතරම් හොඳ වුණත් අපි බොන්නේ රට හුණු කුඩු නම් ලෙඩේ සුව වෙන්නේ නැති නිසයි. මේ කරුණු ගැන අපි අවදියෙන්, සිහියෙන් පසුවිය යුතුය. නියම සතිපට්ඨානය නම් මෙය ය. අප අපට සිදුවන දේවල් පිළිබඳව අප නිරන්තරයෙන් සිහියෙන් පසුවිය යුතුය. ඉන් පසු, කළ යුතු දේ කුමක් ද යන්න පිළිබඳ ප්‍රඥාව අපට ඉබේම මෙන් පහළ වනු ඇත. බෞද්ධ විප්ලවය පිළිබඳ මූලධර්මය වන්නේ මෙය ය. බාහිර සහ අභ්‍යන්තර යන විප්ලව දෙකම කරන්න පුළුවන් එකම මූලධර්මය වන්නේ මෙය ම ය. එය නම් සතිපට්ඨානය නම් විධි ක්‍රමයයි. මෙම උපක්‍රමය අප විසින් හැකි ඉක්මනින් උගත යුතුය. ග්‍රහණය කර ගත යුතු ය. මෙය අල්ලා ගත් විට, නොකළ හැකි කිසිවක් ඇත්තේ නැත.

බටහිර ඖෂධ ගැන තවත් උදාහරණයක් කිය යුතු ය. අපට දරුවන් සිටින නිසාත්, ඔවුන් අසරණ වුන් වන නිසාත් මෙය අප සාවධානව ඇසිය යුතු දෙයක් ව අවධාරණය කළ යුතු ය. කුඩා ළමුන්ට දෙන ප්‍රතිජීවක කුඩු හැටියට බොහෝ විට ඇත්තේ ටැල්කම් පුයර බව ඉහත සඳහන් කළ ටයිම් සඟරාවේ වාර්තා වී ඇත. එසේ නම්, අපේ දරුවන්ගේ නාමයෙන් අප මේ කරුණු ගැන සැලකිලිමත් විය යුතුව ඇත.

අපට මෙතැනදී ලොකු ප්‍රශ්නයක් මතු වෙන බව පෙනේ. අප ගත යුත්තේ මොන බෙහෙත් ද? අප කළ යුත්තේ කුමන වෙදකමද? වෙදකම කොපමණ හොඳ වුණත් අපි ගන්නේ බොරු බෙහෙත් නම්, ඒ වෙදකමෙන් ඇති වැඩය කුමක් ද?

අප මෙලෙස අසරණව සිටින අවස්ථාවේදී අප කාගේ පිහිට සොයමු ද? මෙතැනදී ද අපට පරමාර්ථමය වශයෙන් ම උපකාරයට ඇත්තේ බුදුන් වහන්සේගේ උගැන්වීම් ම පමණ ය. උන්වහන්සේ අපට වෙනම වෛද්‍ය ශාස්ත්‍රයක්ම උගන්වා ඇත. මෙය නම් බෞද්ධ වෙදකම ය. මේ ගැටළු සහගත අවස්ථාවේදී එය කුමක්දැයි හැඳෑරීමට, දැනගැනීමට අප වහා උත්සුක විය යුතු ය. ගැඹුරට එය හැදෑරිය යුතු ය. එයටම සම්බන්ධ වූ අපේ දේශීය වෙදකමක් ද අපට ඇත. දැන් ක්‍රියාත්මක වන බටහිර වෙදකම අවුරුදු 200 කට වඩා පැරණි නැති අතර, අපේ වෙදකම අවුරුදු 3000 ක් තරම් පැරණි වන්නේ ය. අපේ සංස්කෘතිය තුළ මේ ලෝකය එතරම් අද්භූත වූවක් නොවේ. එය සාමාන්‍ය වූ සිද්ධියකි. එමෙන් ම රෝගය යන්නද කිසිම අස්වාභාවික දෙයක් නොව, සාමාන්‍ය වූ දෙයකි. එය ජීවිතයේ සාමාන්‍ය ස්වභාවයයි. මේ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ජීවිතය පිළිබඳ දර්ශනයක් අප සතුව තිබෙනවා. අපි ඒ ගැන ආඩම්බර විය යුතු ය. නමුත්, වැදගත් වන්නේ එය හොඳින් තේරුම් ගැනීම ය. අපේ වෙදකම ආයුර්වේදයට සම්බන්ධ වූවකි. ආයුර්වේදය හින්දු සංස්කෘතියට සම්බන්ධ ය.

එසේ වුවද, ආයුර්වේදයට මහා පරිමාණයෙන් බෞද්ධ බලපෑම ලැබී ඇත. ආයුර්වේදයේ ආරම්භය කෙරෙහි මෙන් ම එහි විකාශනය කෙරෙහි ද බුදුසමය බෙහෙවින් ම බලපා ඇත. එමනිසා, අපේ වෙදකම තුළ ජීවිතය පිළිබඳ දර්ශනයක් අන්තර්ගත ව ඇත. එමෙන්ම රෝග පිළිබඳ දර්ශනයක් ද ඇත. බටහිර වෙදකමේ ඒ දෙකම ඇත්තේ නැත. ඒ අය කරන්නේ ලෙඩේ හැදෙන හැටියට වෙදකම් කිරීම ය. එනම්, බෝලය එන හැටියට ගැහීම, බෝලය එන්නේ කොහෙන්ද, එය ගහන්නේ කවුද කියා තිකමටවත් සොයන්නේ නැත. අපේ වෙදකම ඒ සියල්ල ගැනම මනාව සොයා ගන්නාවූ එකකි. ඒ අනුව, පෙරදිග වෙදකම මගින් මේ ලෝකයේ තිබෙන ගුණ 3 ක් ගැන කථා කර ඇත. සත්ත්ව, රජස් සහ තමස් යනු ඒ ගුණ තුනයි. සත්ත්ව යන ලක්ෂණය හොඳ ලක්ෂණ වලින් යුක්ත වුවත්, එය තුළ අඳුරු පැත්තකුත් ඇත්තේ ය. එය සෙමට සම්බන්ධ ය. රජස් යනු ක්‍රියාකරී ස්වරූපය යි. එය තරගකාරී ස්වරූපය උසුලන ලක්ෂණයකි. එය පිතට සම්බන්ධ ය. තමස් යනු අන්ධකාරය ය. මෝඩකම ය. අවිද්‍යාව ය. මේ ලෝකය සෑදී ඇත්තේ මෙම සත්ත්ව, රජස් සහ තමස් යන ගුණ තුනෙනි. මෙම ගුණ තුන සමතුලිත තත්ත්වයෙන් පවතින විට කිසිදු ප්‍රශ්නයක් නැත. ශරීරය තුළ ද මෙම ගුණ තුන එලෙසම පවතින අතර, ශරීරයේ පවතින මෙම ගුණ තුනේ කුමන හෝ අසමතුලිත භාවයක් ඇති වුවහොත්, රෝගී තත්ත්වයන් ඇතිවෙයි. එමෙන්ම සියළුම රෝග මෙම ගුණ තුන යටතට ගොනු කරනු ලැබ ඇත. රෝගය දෙස බලා එය කුමන ගුණය අසමතුලිත වීම නිසා සිදුවූවක්ද කියා සොයා බලා එම තත්ත්වය සමතුලිත ස්වභාවයට ගෙන ඒම වෙදකමේ අභිප්‍රාය වන්නේ ය.


බෞද්ධ වෙදකම දෙසට එනවිට, එම ආයුර්වේද විග්‍රහය වඩාත් ගැඹුරු මට්ටමකට යයි. සත්ත්ව, රජස් සහ තමස් යන ගුණ තුනට මූලික වන මනෝ මූල තුනක් ගැන බුදුන් වහන්සේ සඳහන් කරති. එනම්, ලෝභ, දෝස සහ මෝහ යනුයෙනි. මෝහයට සම්බන්ධ කරන්නේ සත්ත්ව ගුණ ය. ද්වේෂයට රජස් ගුණය සම්බන්ධ කරන අතර, ලෝභයට සම්බන්ධ වන්නේ තමස් ගුණය ය. ලෝභය සම්බන්ධ වන්නේ වාතයට ය. ද්වේෂය පිතට සම්බන්ධ වන අතර, මෝහය සම්බන්ධ වන්නේ සෙමට ය. මේ සම්බන්ධතාවන් ගැන දළ හව්‍යතාවක් අපට බැලූ බැල්මට දකින්නට පුලවන් වෙයි. උදහරණ වශයෙන් ගතහොත්, කුඩා දරුවන්ට සෙම්රෝග බහුල ය. ඔවුන් තුළ ප්‍රායෝගික වශයෙන් මෝහය වැඩිය. ලෝකය ගැන ඔවුන්ගේ නොදැනීම වැඩිය. ඒ නිසා සෙම් අමාරු බහුල ය. කුඩා දරුවන්ට කැස්ස සහ සෙම්ප්‍රතිශ්‍යාව වැනි සෙම් අමාරු ඉතා බහුල බව අපි කවුරුත් දනිමු. එයට හේතු වන්නේ මෝහයයි. තරුණ කාලයේදී ක්‍රියාකාරී ස්වභාවය සහ තරගකාරී ගතිය ඇතිවෙයි. එකිනෙකා පරදවායාමට ඇති උද්‍යෝගය ඇති වන්නේ ද්වේෂය නිසා ය. මෙම ද්වේෂය නිසා පිත කැළඹේ. තරුණ අයට හිස කැක්කුම බහුලව සැදෙන්නේ ඒ නිසා ය. අන්තිමට එන්නේ ලෝභය ය. වයසට යාමත් සමග වාත අමාරු බහුල වන්නේ ඒ නිසා ය. හන්දිපත් රුදව සහ ආතරයිටිස් වැනි රෝග ඇති වේ. මෙතැනදී මහළු අයට මතුවන ප්‍රශ්නය නම් ජීවිත කාලය පුරාම හරි හම්බ කරගත් දේ අතහැර දමා යන්නේ කෙසේද යන්න ය. රැස්කර ගත් දෙයට ඇති ලෝභය නිසා වාත රෝග හටගනියි.

රෝග පිළිබඳ බෞද්ධ විග්‍රහය එයයි. එම විශ්ලේෂණය මනාව හදරා අවබෝධයෙන් ග්‍රහණය කර ගතහොත් තමන්ගේ රෝගවලට පිළියම් සොයමින් වෙද මහතුන් හෝ දෙස්තරවරු සමුවීමට යන්නට අවශ්‍ය කමක් ඇතිවන්නේ නැත. රෝගවලට හේතු වූ අකුශල මූලයන් හැඳිනගෙන ඒවාට ප්‍රතිපක්ෂ වූ කුශල මූලයන් වර්ධනය කිරීමෙන් රෝග සුවකර ගත හැකි වන්නේ ය. ඒවා නම් අලෝභ, අදෝස සහ අමෝහය හෙවත් දන, සීල, භාවනා යන කරුණු ප්‍රගුණ කිරීම ය. බෞද්ධ සාහිත්‍යයේ ගැනෙන අන්දමට, බුද්ධ කාලයේ දී භික්ෂූන් ගිලන් වූ විට කර ඇත්තේ ධර්මයට සවන්දීම ය. බොහෝ එබඳු අවස්ථාවලදී දේශනා කර ඇත්තේ සප්ත බොජ්ඣංග ධර්මයන් ය. ගිරිමානන්ද සූත්‍රය හොඳ උදහරණයකි. බුදුන් වහන්සේ ලෙඩ වූ අවස්ථාවකදී මහා චුන්ද හිමියන් ලවා ධර්මය දේශනා කරවා ගෙන සුවය ලබා ගත් බව සඳහන්ව ඇත.

පරමාර්ථමය බෙහෙත එය වුවත් අධ්‍යාත්මික දියුණුවෙන් මදි අයට එය ක්‍රියාත්මක නොවිය හැකි නිසා එබඳු අයට සාමාන්‍ය ඖෂධ වර්ග බුදුන් වහන්සේම විසින් පවා නිර්දේශ කර ඇත. එකල නිර්දේශ කළ බොහෝ ඖෂධ අද දක්වාම ඉතා බලසම්පන්න ඖෂධ හැටියට ක්‍රියාත්මක වෙමින් පවතින්නේය. බෞද්ධ වෙදකම ලංකාවේ ද ක්‍රියාත්මක වන අතර මෑතක් වන තුරු එය ඉතා ප්‍රබලව ක්‍රියාත්මක වූ රට නම් තිබ්බතය ය. වර්තමානයේ එය දළයි ලාමා දැනට වැඩ වසන ඉන්දියාවේ ධර්මශාලා නම් ප්‍රදේශයේ ක්‍රියාත්මක වන අතර එම ප්‍රතිකාර පතා බොහෝ බටහිර වැසියෝ පැමිණෙති.

බෞද්ධ වෙදකම ලංකාවේ ක්‍රියාත්මක වන්නේ අපේ දේශීය වෙදකම ඇසුරිනි. එය ආයුර්වේදය මත පදනම්වන අතර සුවිශේෂ බෞද්ධ ඉගැන්වීම්වලින් එය පරිපෝෂිත වෙයි. එහි ඇති අනෙක් විශේෂත්වය නම් එය ශාක වර්ගවලට ඉතා කිට්ටුවෙන් සම්බන්ධ වී තිබීම ය. අපේ මූලික වෙදකම ගත් විට එය සම්පූර්ණයෙන් ම මෙන් පැලෑටි මත පදනම් වූවකි. අපේ වෙදකමේ ඇති ඉමහත් ආශ්චර්යජනක ස්වභාවය නම් එය මය. මේ ආකාරයෙන් මෙය එක් පැත්තකින් ධර්මයට සම්බන්ධ වන අතර අනෙක් පැත්තෙන් පරිසර ය හා සම්බන්ධ වෙයි. මා හිතන හැටියට, පරිසරයට සම්බන්ධ ඉතාම උසස් දර්ශනය තිබෙන්නේ අපේ දේශීය වෙදකමේයි. අපේ චින්තනයේයි. බෙහෙත් සල්ලිවලට ගන්න සංකල්පයක් අපට ඇත්තේ නැත. සියළු බෙහෙත් පැළ ඉබේම හැදෙන ඒවා ය. අවශ්‍ය වන්නේ රෝගය හැදෙන විට ම එය කුමන දෝෂයන්ට සම්බන්ධ වන්නේ දැයි හැඳිනගෙන, එයට සුදුසු නියම බෙහෙත මුල් අවස්ථාවේ දී ම යෙදී ම ය. එමෙන් ම, කරුණු නියම වශයෙන් අවබෝධ කරගෙන එම වෙදකම ගැන බලවත් විශ්වාසයක් සහ ගැඹුරු භක්තියක් අප තුළ ඇති කර ගැනීම ය. ඒ සඳහා අවශ්‍ය සත්‍ය වූ සාධක ඕනෑ තරම්

අපේ මූලික වෙදකම ගත් විට එය සම්පූර්ණයෙන් ම මෙන් පැලෑටි මත පදනම් වූවකි. අපේ වෙදකමේ ඇති ඉමහත් ආශ්චර්යජනක ස්වභාවය නම් එය මය. මේ ආකාරයෙන් මෙය එක් පැත්තකින් ධර්මයට සම්බන්ධ වන අතර අනෙක් පැත්තෙන් පරිසර ය හා සම්බන්ධ වෙයි..





අපේ වෙදකමේ අති සරල බවද අප විසින් අගය ක යුතුව තිබෙනවා. ලෙඩක් හැදුනු විට කරන්න ඇත්තේ ගේ අවට ඇති කොළ ටිකක් කඩා, මිරිකා හෝ තම්බා බොන එක විතරක් නම්, ඊට වඩා භාග්‍යක්

අපට පහසුවෙන්ම සොයා ගත හැකිය. එනම්, අපට තිබෙන්නේ අවුරුදු 3000 ක් පමණ කාලයක් තිස්සේ අඛණ්ඩව එකම බෙහෙත් වට්ටෝරු පාවිච්චි කරමින් මේ මිනිස් ලෝකයේ අද වෙන තුරු කෝටි ප්‍රකෝටි ගණන් මිනිසුන්ගේ ලෙඩ සුව කළ වෛද්‍ය ක්‍රමයකි. එම ක්‍රමය දැන් වැඩ නොකරන්නට කිසිම හේතුවක් ඇත්තේ නැත. මේ පසුගිය අවුරුදු 200 තුළ දී කිසියම් හෝ හදිසි විපතක් එයට සිදුවී ඇත්තේද නැත.

බටහිර මිනිසුන්ට රැවටීම නිසා, ඒ අයගේ පොඩි පොඩි මැජික්වලට රැවටීම නිසා ඒවා පස්සේ ගොස් අපි දැන් විහිළු නැහෙන තත්ත්වයක් උදාකරගෙන සිටින්නෙමු. අපේ වෙදකමේ අති සරල බවද අප විසින් අගය කළ යුතුව තිබෙනවා. ලෙඩක් හැදුනු විට කරන්න ඇත්තේ ගේ අවට ඇති කොළ ටිකක් කඩා, මිරිකා හෝ තම්බා බොන එක විතරක් නම්, ඊට වඩා භාග්‍යක් මේ මිහිපිට තිබිය හැකි ද?

මෙතැන ඇත්තාවූ මූලධර්මය අප විසින් අවබෝධ කොට යුතුයි. එමගින් මේ මහ පොළොව සහ මේ ලෝකය ආරක්ෂා කර ගන්න ශක්තියක් අපට ලැබෙයි. අනෙක් පැත්තෙන්, එහි මානසික පැත්තට යන විට අපවත් ආරක්ෂා වෙන තත්ත්වයක් උදා වෙයි. ලෙඩ සනීපවීම පමණක් නොව, අපේ අධ්‍යාත්මික විමුක්තිය ද එයින් සැලසෙන්නේය. ලෙඩ සනීපවීමට සමගාමීව නිවන් යන්නට ද හැකියාව ලැබෙන්නේ ය. විශේෂයෙන්ම, සල්ලි අග හිඟ මෙබඳු යුගයක දී මෙවැනි දෙයක් තේරුම් ගන්න පුළුවන් වුවහොත් ආර්ථික වශයෙනුත් විශාල ප්‍රයෝජනයක් අත් වන්නේ ය.

මෙතැනදී මෙම මූල ධර්මය තේරුම් ගැනීම සඳහා උපකාරී වන විධික්‍රමය නම් සතිපට්ඨාන භාවනා ක්‍රමයයි. සතිපට්ඨානය යනු එක තැනක පලක් බැඳගෙන පැය භාගයක් ඉඳගෙන ඉන්න එකට නොවේ. එය මුළු ජීවිත කාලය තුළදී ම දිගට ම කළ යුත්තකි. අපි ඒ ඉඳගෙන කරන්නේ පොඩි අභ්‍යාසයක් පමණයි. අවසානය කිසිසේත්ම එය නොවේ. එයින් අප අල්ලා ගත යුතු හෙවත් ග්‍රහණය කර ගත යුතු පාඩම නම්, මේ සිහිය පිහිට වීම යන්න කරනනේ කෙසේ ද යන වගයි. ඒ ක්‍රමය ග්‍රහණය කර ගැනීමෙන් පසු, වහාම එය එදිනෙද ජීවිතය සම්බන්ධව එදිනෙද කෙරෙන සියලු වැඩ කටයුතු සම්බන්ධව භාවිත කළ යුතු වන්නේය. එවිට අපට මූලික වශයෙන් පෙනෙන්නට පටන් ගන්නා වූ දෙයක් නම් සිතිවිලි ය. සිතිවිලි දෙස සිහිය පිහිටුවා ගෙන බලාගෙන සිටින විට අපි ඒවායේ, එනම්, විවිධ දෘෂ්ටීන්ගේ පාලනයෙන් මිදෙන්නෙමු. ඉන් පසු, අපට පේන දෙය ඇති සැටියෙන් දකින්නට අපට හැකියාව ලැබෙයි. අපට දැන් සත්‍යය දකින්න නොහැකිව ඇත්තේ අප දෘෂ්ටි වාදවල සිර වී සිටින නිසා ය. එයින් ගැලවීමට ඇති එකම ක්‍රමය නම් සිහිය පිහිටුවීම, එනම් සතිපට්ඨානය, පමණ ය. සිහිය පිහිටුවීම තුළින් අපි මෙතැනදී කරන්නේ කෙළින් ම අපි අර අපේ මූලික පරමාර්ථමය තත්ත්වය කරා ගමන් කිරීමයි. එතැනට ගොස් ඊළඟට අපි කරන්නේ කුමක්දැයි මෙතැනදී කෙනෙකුට අසන්න පුළුවනි. ඒ ප්‍රශ්නය අසන්න කිසිම අවශ්‍ය කමක් නැත. එතැනට ගිය විට ඉතිරි ටික පෙනෙනු ඇත. එයට හේතුව මෙයයි. බෞද්ධ චින්තනයට අනුව අපි සැම දෙනා තුළම බුද්ධ බීජය ඇත. පරමාර්ථමය වශයෙන් අප සැම දෙනාම බුද්ධත්වය තුළ පසුවෙන්නෙමු. ඒ නිසයි බුදුන් වහන්සේ මෙසේ දේශනා කළේ. 'පභස්සරමිදං භික්ඛවේ චිත්තං ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං.' 'මහණෙනි, මේ සිත ප්‍රභාස්වරයි, එය ආගන්තුක වූ කෙලෙස් වලින් කිළුටු වී ඇත්තේ ය.'

දැන් අපට කරන්න ඇත්තේ එකම දෙයයි. එනම්, පිටින් ආගන්තුකව ඇවිත් තියෙන අනන් මනම් ටික සිතෙන් අයින් කර දමන එක පමණයි. එය කළ හැකි එක ම විධි ක්‍රමය නම් සතිපට්ඨානය පමණ ය. ඒ තුළින් බුද්ධ බීජය තුළට ඇතුළු වන්නට අපට හැකියාව ලැබෙයි. අපේ සෞඛ්‍ය සහ මෝක්ෂය යන දෙක ම අපට සොයාගන්නට තිබෙන්නේ ඒ තුළ ය.

**(මෙම ලිපිය සකස් කරන ලද්දේ 1998 ඇසළ පුන් පොහෝද මහරගම සාසන සේවක සංගමය අමතා කරන ලද කථාවක් ඇසුරිනි. එම කථාවට පදනම් වූයේ මෙම කර්තෘ විසින් සකස් කර 1998 දී ප්‍රකාශයට පත් කරන ලද 'වෛද්‍ය ශාස්ත්‍රයේ ස්වභාවය' නම් ග්‍රන්ථයයි.)**